

**නම් තැබීමේ මංගල්‍යයේ දී බ්‍රාහ්මණ පඬිවරුන් අතර වූ**
**කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණ තෙමේ කුමරු ඒකාන්තයෙන්ම බුදුවන බව පවසමින් .....**

---

## ❋ විශ්වයේ නිර්මාණයට පිළිතුරු අන්තවාදයෙන් බැහැරව සොයමු

– පිටිදූවේ සිරිධම්ම හිමි

විශ්වයේ පැවැත්ම පිළිබඳව විද්‍යා මත, වෙනත් විවිධ ආගමික මත සහ බුදුවදනෙන් ඉදිරිපත් වී ඇති අදහස් අතර තුලනාත්මක විමසුමකි. විද්‍යා විෂය ක්ෂේත්‍රය අධ්‍යයනය කළ විද්වත් හිමිනමක් සමඟ සිදුකරන ලද සාකච්ඡාවක් ඇසුරෙන් සකස් කැරුණු ලිපියකි.

## ❋ යහපත් ප්‍රතිඵල ලැබීමට පරිත්‍රාණ ධර්ම දේශනාවක් පවත්වන්නේ කෙසේ ද?

– ඩී. එම්. සිරිනායක

තෙරුවන් ගුණ බල අන්තර්ගත සත්‍යක්‍රියාවක් ලෙස ප්‍රකට පරිත්‍රාණ ධර්ම දේශනය පැවැත්විය යුතු පිළිවෙළ. ශ්‍රාවකයනට උපරිම ශාන්තියක් ලැබෙන පරිදි පිරිත් දෙසුම පැවැත්විය යුතු ආකාරය පාඨකයාට පහදා දීමට කරන උත්සාහයකි.

## ❋ Why I became a Buddhist
## බුදුහිමිගේ ප්‍රඥාව හා කරුණාව මා බෞද්ධයකු කළා

– සාත්‍රමෙත්තුහී උපතිස්ස හිමි

බුදුදහම ගැන පැහැදී – තෙරුවන් සරණ ගොස් – පසුව පැවිදි බිමට ඇතුළු වූ ඇමෙරිකන් ජාතික හිමිනමක් සමඟ බුදු දහමේ විශේෂත්වය පිළිබඳ සිදු කැරුණු සාකච්ඡාවක් ඇසුරෙන් සකස් කැරුණු ලිපියකි.

## ❋ සමාජගත ගැටලු නිරාකරණයට බුදු දහමෙන් ආලෝකයක්

– පී. කේ. කුමුදු උපුල් පෙරේරා

පෞද්ගලික ගැටලු මෙන්ම සමාජගත සංකීර්ණ ගැටලු ද විදීමෙහිලා බෞද්ධ ජීවන දර්ශනයෙහි උපයෝගීතාව. පුද්ගලයා දුශ්චරිතයට පොළඹ වන සමාජගත හේතු සාධක හා වර්ග භේදවාදී ගැටුම් සමනය කිරීමෙහිලා බුදු වදනෙන් ලැබෙන මඟපෙන්වීම.

## ❋ පංචසීල ප්‍රතිපත්තියෙහි දැක්වෙන සමාජ දර්ශනය

– ආචාර්ය ඩබ්ලිව්. ජී. වීරරත්න

සමාජයක යහ පැවැත්ම හා අභිවෘද්ධිය උදාකිරීමෙහිලා පංචශීල ප්‍රතිපත්තියේ ඵලදායක බව. පංචශීල ප්‍රතිපත්තිය තුළින් හෙළිවන ප්‍රජාතන්ත්‍රවාදී – සමාජවාදී ප්‍රගතිශීලී සමාජ දර්ශනය.

## ❋ මරණය ජය ගත හැකි මඟ

– ගොඩගම චන්ද්‍රදස්සි තෙරණිය

මරණය නමැති යථාර්ථය පිළිබඳ නිසි අවබෝධය බෞද්ධ විමුක්ති ප්‍රතිපදාව ඇරැඹීමට ඉවහල් වන ආකාරය ජීවිතය තුළ පුද්ගලයා මානසික වශයෙන් ගොඩනඟන බොහෝ ගැටලු නිරාකරණය කිරීමෙහිලා මරණය පිළිබඳ ගැඹුරු අවබෝධය උපයෝගී වන ආකාරය.

## ❋ සදහම් දැනුම

– වහුමුවේ විජයවංශ නා හිමි

බුදුදහම ඇසුරු කොටගත් විෂය ක්ෂේත්‍ර යටතේ සරල ප්‍රශ්න හා පිළිතුරු ඉදිරිපත් කොට ඇති ලිපියකි. බුදු දහම ඉගෙනගන්නා සිසුන්ට මෙන්ම වැඩිහිටියන්ට ද එක සේ ප්‍රයෝජනවත් ලිපියක් ලෙස සැලකිය හැකිය.

## ❋ නිවන් මඟට මඟ

– දියසෙන්පුර විමල හිමි

මෙවර ‘පොහෝද ධර්ම දේශනාව’ විමුක්තිය ලැබීම සඳහා පුද්ගලයා අනුගමනය කළ යුතු – සිත පිරිසුදු කිරීමේ පිළිවෙත පැහැදිලි කළ බුද්ධ දේශනාවකට අර්ථකථනයකි. බුදු දහමේ සඳහන් අනුපූර්ව ප්‍රතිපදාව ප්‍රකට වන දෙසුමක් පිළිබඳ විමසුමක් හැටියට ද මෙම ධර්ම දේශනාව හැඳින්විය හැකිය.

## ⁂ සාර්ථක දිවියකට ධම්මපදයෙන්

– දිවියාගහ යසස්සි නා හිමි

'ධම්මපදය' නමැති ප්‍රකට බෞද්ධ ග්‍රන්ථයෙහි ඇතුළත් ගාථා පාඨයන්හි අර්ථ විවරණය කැරෙන විශේෂාංගයකට අයත් ලිපියකි. සාර්ථක ජීවිතයකට මග කියන ධර්මෝපදේශ රැසක් පිළිබඳව විමර්ශනයක් හැටියට – මෙම විශේෂාංගය හැඳින්විය හැකිය.

## ⁂ ලංකාතිලක විහාරය

– ගාමිණී සමරනායක

මහනුවර දිස්ත්‍රික්කයට අයත් උඩුනුවර ප්‍රදේශයේ පිහිටි ඉපැරැණි ඓතිහාසික විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු.

## ⁂ බුද්ධ නීතිය හා රාජ නීතිය

– නාකුළුගමුවේ සුමන හිමි

ලෝකයේ විවිධ රාජ්‍ය තුළ විවිධ නීති ක්‍රම බිහිවීම පිළිබඳ ඉතිහාසගත තොරතුරු සහ බුදුරදුන් තම ශ්‍රාවක සමාජය පාලනය කිරීම සඳහා උපයෝගී කරගත් ශික්ෂා හා විනය නීති පිළිබඳ තුලනාත්මක අධ්‍යාපනයක් හැටියට මෙම ලිපිය හැඳින්විය හැකිය.

## ⁂ Impotance of Dhamma Education

***- by Aryadasa Ratnasinghe***